## 3

පසසමි සමිඳේ මාගේ දිවියේ
මා ගත් සැම සුසුමක් ගානේ
ඔබගේ කරුණා මාගේ දිවියේ
සැම මොහොතෙම මා හා වූයේ



තුති දෙමි සමිඳේ හිරු නැග උදයේ
නැවතත් බසිනාතුරු අවරේ
බැස හිරු අවරේ නැවතත් උදයේ
නැගෙනාතුරු පසසමි සමිඳේ

ඔබේ කරුණාවෙන් සැම මොහොතෙම මා දිවියේ
තුති දෙමි සමිඳුනි වෙනුවෙන් මා ලැබූ සැමදේ
අයදිමි වරයක් සමිඳුනි පතුලෙන් මහදේ
ඔබ වෙත මට පෙන්වනු මැන අවසන් මොහොතේ

අයදිමි සමිඳේ පියුමේ පෙති සේ
ඔබ හා එක්වී සිටින ලෙසේ
ඔබගේ කරුණා සුවඳින් මාගේ
දිවියම සුවඳින් පිරෙන ලෙසේ

අයදිමි සමිඳේ නොපැකිල ඔබගේ
ජය මග යන්නට හැකිවනසේ
ඔබගේ දිවියේ එළියෙන් මාගේ
ජීවිත ඝනඳුර පහවන සේ